සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියේ ගොවිපල් කළමනාකරු, ව්‍යාප්ති නිලධාරි හා තාක්‍ෂණික නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016)

## (02) පොදු පරීක්‍ෂණය I
## (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්‍ෂණය)

(පැ තුනයි)

● ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

1. කෘෂිකර්මය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ස්ථානයක් දරන අතර රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට ප්‍රධාන වශයෙන් දායක වේ.

(i) (අ) 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දායකත්වය කොපමණ ද?

(ආ) 2013 වසරට සාපේක්‍ෂව 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධන වේගය කොපමණ ද?

(ඉ) සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වූ ආයතනය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලෙස නම් කරනු ලැබුවේ කුමන වසරේ දී ද?

(ඊ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රථම පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ ශ්‍රී ලංකාවේ කුමන දිස්ත්‍රික්කයේ ද?

(උ) පහත එක් එක් කාණ්ඩය යටතේ ශ්‍රී ලංකාව බෙදා ඇති කලාප සංඛ්‍යාව වෙන වෙනම දක්වන්න.

I. කෘෂි දේශගුණික කලාප    II. කෘෂි පාරිසරික කලාප

(ii) (අ) පසට යොදන ලද රසායනික හෝ කාබනික පොහොරවල අඩංගු නයිට්‍රජන්, ශාකවලට අවශෝෂණය කරගන්නා ප්‍රධාන ආකාර මොනවා ද?

(ආ) නයිට්‍රජන් තිරකරන බැක්ටීරියාවල වැදගත්කම කුමක් ද?

(ඉ) ජලයේ අධික ලෙස නයිට්‍රේට් අයන තිබීමේ ප්‍රධානතම ගැටලුව කුමක් ද?

(ඊ) ශාකවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(iii) (අ) ශාකවල පරිවෘත්තීය ක්‍රියාවලියේ දී පොස්ෆරස්වල ප්‍රධාන කාර්යයන් කවරේ ද?

(ආ) ශාක වර්ධනයේ දී පොටෑසියම්වල ප්‍රධාන කාර්යයන් මොනවා ද?

(iv) (අ) 'දේශගුණික විපර්යාස' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ආ) බෝග නිෂ්පාදනයට දේශගුණික විපර්යාස මගින් ඇති වන ප්‍රධාන බලපෑම් මොනවා ද?

2. (i) (අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශය කුමක් ද?

(ආ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාංශ හතර නම් කරන්න.

(ii) පහත දැක්වෙන එක් එක් අපනයන කෘෂිකර්ම බෝගයේ විද්‍යාත්මක නම වෙන වෙනම සඳහන් කරන්න.

(අ) කුරුඳු    (ආ) කරාබු    (ඉ) එනසාල්    (ඊ) ගම්මිරිස්
(උ) සාදික්කා    (ඌ) පුවක්    (එ) බුලත්    (ඒ) කොකෝවා
(ඔ) වැනිලා    (ඕ) ඉඟුරු

(iii) පහත දැක්වෙන බෝගවල වර්ධනය සහ අස්වැන්න සඳහා පොහොර භාවිතයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(අ) කුරුඳු    (ආ) ගම්මිරිස්

(iv) පහත දැක්වෙන එක් එක් බෝගය වගා කරන ප්‍රදේශ සහ ඊට සුදුසු පාංශු තත්ත්ව වෙන වෙනම සඳහන් කරන්න.

(අ) කුරුඳු    (ආ) පුවක්    (ඉ) කහ    (ඊ) සාදික්කා    (උ) කොකෝවා

[ 2 වැනි පිටුව බලන්න.

**3.** ගෝලීය වශයෙන් විවිධ ශාකවල පැවැත්ම සඳහා විවිධ ප්‍රචාරණ ක්‍රම දායක වී ඇත.

(i) පහත දෑ අර්ථ දක්වන්න.

(අ) අග්‍රස්ථ ප්‍රමුඛතාව (ආ) අනුජය

(ඉ) ග්‍රාහකය (ඊ) ලිංගික ප්‍රචාරණය

(උ) අලිංගික ප්‍රචාරණය

(ii) ශාකවල ලිංගික ප්‍රචාරණයේ ඇති වාසි හා අවාසි පැහැදිලි කරන්න.

(iii) කුරුඳු වගාව තුළ දක්නට ඇති පළිබෝධ හානියක ලක්ෂණ පහත දැක්වේ.

"සුහුඹුල් සතුන් කුරුඳු ශාකයේ කඳේ පාදස්ථ ප්‍රදේශයේ බිත්තර දමන අතර ඉන් පිටවන කීටයින් කඳේ පටක ආහාරයට ගනිමින් පස ආසන්නයේ වූ කඳ දක්වා ගමන් කරයි. මෙම හානිය වයසින් වැඩි පරිණත කුරුඳු වගාවල බහුලව දක්නට ලැබේ. මෙම පළිබෝධ හානියේ ප්‍රතිඵලයක් ලෙස අලුතින් හටගන්නා අංකුර මියයාම, සමහර පරිණත කඳන් පාදස්ථ ප්‍රදේශයෙන් කඩා වැටීම, අලුත් අංකුර හටගැනීම දුර්වලවීම ආදිය සිදුවිය හැකි ය. අවසානයේ දී සම්පූර්ණ පඳුරම මියයාම සිදු වෙයි."

(අ) මෙම හානිය සිදු කරන පළිබෝධයාගේ සාමාන්‍ය නම සඳහන් කරන්න.

(ආ) එම පළිබෝධයාගේ විද්‍යාත්මක නම සඳහන් කරන්න.

(ඉ) මෙම පළිබෝධ හානිය පාලනය කළ හැකි ක්‍රම මොනවා ද?

(iv) (අ) 'ඒකාබද්ධ පළිබෝධ පාලනය' කෙටියෙන් විස්තර කරන්න.

(ආ) පහත සඳහන් එක් එක් රෝගයේ රෝග කාරකයාගේ විද්‍යාත්මක නම සඳහන් කරන්න.

I. කුරුඳුවල සුදු මුල් රෝගය

II. බුලත්වල බැක්ටීරියානු කොළඅංගමාරය

(ඉ) ඉහත iv (ආ) හි හඳුනාගත් එක් එක් රෝග කාරකයා මර්දනය කළ හැකි ක්‍රමයක් වෙන වෙනම දක්වන්න.

4. (i) පොහොර සහනාධාරය ලබාදීම ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ii) (අ) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ගොවීන් මුහුණදෙන ප්‍රධාන අභියෝග පහක් සඳහන් කරන්න.

(ආ) තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් වෙනුවෙන් ඉහත ii (අ) හි හඳුනාගත් එක් එක් අභියෝගය ජයගත හැකි ක්‍රම වෙන වෙනම පැහැදිලි කරන්න.

(iii) කාබනික ගොවිතැන මගින් ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය දියුණු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ වර්තමානයේ බලපවත්වන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය, අනාගතයට සරිලන අයුරින් සකස් විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

5. (i) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග වර්ග පහකි.

I. කුරුඳු II. ගම්මිරිස් III. එනසාල්

IV. කරාබු V. සාදික්කා

(අ) ඉහත එක් එක් බෝගය ශ්‍රී ලංකාව මගින් ප්‍රධාන වශයෙන් අපනයනය කරනු ලබන රට වෙන වෙනම සඳහන් කරන්න.

(ආ) ඉහත එක් එක් බෝගයේ ප්‍රධාන වශයෙන් අන්තර්ගත රසායනික සංයෝගය හෝ සගන්ධ තෙල්වල නම් සඳහන් කරන්න.

(ii) කාබනික ගොවිතැන් ක්‍රම භාවිතයෙන් අපනයන බෝග වගා කිරීමේ වාසි මොනවා ද?

(iii) (අ) ගම්මිරිස්, ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා රෝපණ ද්‍රව්‍ය තෝරාගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ආ) බුලත් වගාවක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(iv) (අ) "කෘෂි ව්‍යාප්ති සේවය" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(ආ) ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්මාන්තයේ සාර්ථකත්වය සඳහා කෘෂි ව්‍යාප්ති සේවය වඩාත් ඵලදායීව යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න.

* * *